මෝසම

<u>ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේදීය</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව ප්‍රකාර ඉදිරිපත් කෙරෙන ඉල්ලීමයි.

නාගනන්ද කොඩිතුවක්කු
මහජන අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නීතිඥ
අංක 99
සුභද්‍රාරාම පාර
නුගේගොඩ

SC FR/338/2018

<u>පැමිණිලිකරු</u>

1. රනිල් වික්‍රමසිංහ
   අග්‍රාමාත්‍ය
   අග්‍රාමාත්‍ය කාර්යාලය
   58, අර්නස්ට් ද සිල්වා මාවත
   කොළඹ

2. කරු ජයසූරිය
   කථානායක
   ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුව
   ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

3. නීතිපති
   නීතිපති දෙපාර්තමේන්තුව
   කොළඹ 12.

<u>ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ අනෙකුත් සියළුම විනිසුරුවරුන් වෙත</u>

මා විසින් මේ සමග ඉදිරිපත්කරන ලද පෙත්සම, දිවුරුම් පෙත්සම සහ ඒ සමග ඉදිරිපත්කරන ලද X1 සිට X5 දක්වා ලකුනු කරන ලද ලේඛණ (පිටපත් 5 ක්) පිළිගෙන ගොනු කරන ලෙසත්;

රට තුල පෙත්සමේ සඳහන් කරුණු හේතුවෙන් උද්ගත වී ඇති බැරෑරුම් කලබලකාරී හා නොසන්සුන්කාරී තත්වය නීතියේ ආධිපත්‍ය බිඳ වැටීමට සෘජුවම පාදක වී ඇති හෙයින්

මෙම පෙත්සම වහාම විභාගයට ගැනීම සඳහා නියම කරන ලෙසත් මෙයින් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

N. Kodituwakku

නාගානන්ද කොඩිතුවක්කු
Attorney-at-Law & Commissioner for Oaths
99, Subadrarama Rd, Nugegoda
මහජන අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නීතිඥ

වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර මස 30 වන දින දීය

පෙත්සම

<u>ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේදීය</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව ප්‍රකාර ඉදිරිපත් කෙරෙන ඉල්ලීමයි.

නාගනන්ද කොඩිතුවක්කු
මහජන අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නීතිඥ
අංක 99
සුභද්‍රාරාම පාර
නුගේගොඩ

<u>පැමිණිලිකරු</u>

1. රනිල් වික්‍රමසිංහ
   අග්‍රාමාත්‍ය
   අග්‍රාමාත්‍ය කාර්යාලය
   58, අර්නස්ට් ද සිල්වා මාවත
   කොළඹ

2. කරු ජයසූරිය
   කථානායක
   ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුව
   ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

3. නීතිපති
   නීතිපති දෙපාර්තමේන්තුව
   කොළඹ 12.

<u>ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ අනෙකුත් සියළුම විනිසුරුවරුන් වෙත</u>

පෙත්සම්කරු ගරු අධිකරණය වෙත පුද්ගලිකව ඉදිරිපත් වෙමින් තම පෙත්සමෙන් මෙසේ කියා සිටි.

1. 1 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා ජනරජයේ අග්‍රාමාත්‍යවරයාද 2 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා ජනරජයේ කථානායකවරයාද සහ 3 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා ජන රජයේ නීතිපති වරයාද වන්නේය. 3 වන වගඋත්තරකරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35(1) වගන්තිය ප්‍රකාර ජනරජයේ විධායක ජනාධිපතිවරයාද 126 වන වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති ප්‍රකාර ජනරජයේ නීතිපති ධූරයද නියෝජනය කරයි.

2. ශ්‍රී ලංකාවේ පුරවැසියකු, මහජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පෙනී සිටින, ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත කිරීමට කැප

වී ක්‍රියා කරන පෙත්සම්කරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තිය ප්‍රකාරව මෙසේ ප්‍රකාශ කර සිටින වග නම්;

3. පෙත්සම්කරු සහ ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිකාරී බලධරයා වන මහජනතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ රටේ නීතිය ආරක්ෂා කිරීමට බැඳී සිටී. එසේම පෙත්සම්කරු මහජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පෙනී සිටින නීතිඥයකු වශයෙන් තම හෘද සාක්ෂිය අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

4. 2018 ඔක්තෝබර් මස 26 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ජාතික ආණ්ඩුව නියෝජනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන කණ්ඩායම ජාතික රජයේ අමාත්‍ය මණ්ඩලයෙන් ඉවත්ව යන ලදී.

5. ඒ අනුව ජාතික ආණ්ඩුව තවදුරටත් ක්‍රියාත්මක නොවන හෙයින් ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන කණ්ඩායම අමාත්‍ය මණ්ඩලයෙන් ඉවත්ව ගිය පසුව අමාත්‍ය මණ්ඩලය 30 දෙනකු ඉක්මවන හෙයින් එම අමාත්‍යමණ්ඩලය ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(1) ව්‍යවස්ථාව ප්‍රකාරව නීතිවිරෝධී මෙන්ම බලරහිත වන්නේය.

6. ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනරජයේ අමාත්‍ය මණ්ඩලය නිශ්චිතවම 30 දෙනෙකු නොඉක්මවිය යුතුය. එසේ වුවද ජාතික ආණ්ඩුවක් පත් වූ අවස්ථාවක මෙම විධිවිධානය ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව ප්‍රකාරව එම නෛතික ප්‍රතිපාදනය අදාළ නොවන්නේය.

7. එදිනම පලවන වගඋත්තරකරු ජනරජයේ අග්‍රාමාත්‍ය ධූරයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42(4) දරන ව්‍යවස්ථාව ප්‍රකාරව ඉවත්කරන ලද අතර එය ශ්‍රී ලංකා ජනරජයේ 26.10.2018 දිනැති අංක 2494/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ජනතාව වෙත නිවේදනය කරන ලදී.

*එම 26.10.2018 දිනැති අංක 2494/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පිටපතක් "X1" වශයෙන් ලකුණුකර මේ සමග ඉදිරිපත් කෙරේ.*

8. එදිනම ජනරජයේ විධායක ජනාධිපතිවරයා විසින් කුරුණෑගල පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ ශ්‍රී ලංකා ජනරජයේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් පත්කරන ලද අතර ඒ බව 26.10.2018 දිනැති අංක 2494/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ජනරජයේ පරම අධිකාරී ජනතාව වෙත නිවේදනය කරන ලදී.

එම 26.10.2018 දිනැති අංක 2494/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පිටපතක් "X2" වශයෙන් ලකුණුකර මේ සමග ඉදිරිපත් කෙරේ.

9. ජනරජයේ විධායක ජනාධිපතිවරයා විසින් කුරුණෑගල පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ ශ්‍රී ලංකා ජනරජයේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් පත්කිරීමෙන් අනතුරුවද ජාතික ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කල රනිල් වික්‍රමසිංහ තමන් තවදුරටත් ජනරජයේ අග්‍රාමාත්‍යවරයා බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(2) වන ව්‍යවස්ථාවේ දක්වා තිබෙන අග්‍රාමාත්‍යවරයා ඉවත්කිරීම සඳහා සලසා ඇති විධිවිධාන කිසිවක් තමන් විසින් උල්ලංඝනය කර නොමැති බවත් එහෙයින් තමන් අග්‍රාමාත්‍ය ධූරයෙන් ඉවත්වීම ප්‍රතික්ෂේප කරන බවත් ජනමාධ්‍ය ඔස්සේ එදිනම එනම් 2018 ඔක්තෝබර් 26 වන දින ප්‍රකාශ කරන ලදී.

10. මේ අතර ජනරජයේ විධායක ජනාධිපතිවරයා විසින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 70 වන වගන්තිය ප්‍රකාර 2018.10.27 වන දින දවල් 12.00 සිට ක්‍රියාත්මක වන පරිදි පාර්ලිමේන්තුව 27.10.2018 දිනැති අංක 2494/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2018.11.16 දක්වා කල්තබන ලදී.

*එම 27.10.2018 දිනැති අංක 2494/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පිටපතක් "X3" වශයෙන් ලකුණුකර මේ සමග ඉදිරිපත් කෙරේ.*

11. පසුදින එනම් 2018.10.28 වන දින පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ආර්.සම්බන්ධන් විසින් නීතියේ ආධිපත්‍ය ගරු කරමින් වහාම පාර්ලිමේන්තුව කැඳවන ලෙස 2 වන වගඋත්තරකරුට ඉල්ලීමක් කරන ලදී.

*එම 2018.10.28 දිනැති කථානායක අමතමින් විපක්ෂනායකවරයා විසින් යවන ලද ලිපියේ පිටපතක් "X4" වශයෙන් ලකුණුකර මේ සමග ඉදිරිපත් කෙරේ.*

12. එදිනම එනම් 2018.10.28 ජනරජයේ කථානායකවරයා විසින් විධායක ජනාධිපතිවරයා අමතමින් අග්‍රාමාත්‍ය තනතුරෙන් ඉවත්කරන ලද රනිල් වික්‍රමසිංහගේ වරප්‍රසාද තවදුරටත් ආරක්ෂා කරන ලෙස තමන්ට ඉල්ලීමක් අග්‍රාමාත්‍යගෙන් ලැබී ඇති බවත් එම ඉල්ලීම සාධාරණ ඉල්ලීමක් බවත් දන්වා ඇත.

*විධායක ජනාධිපතිවරයා වෙත කථානායකවරයා විසින් යවන ලද 2018.10.28 දිනැති ලිපියේ පිටපතක් මේ සමග X5 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කෙරේ*

13. පරමාධිකාරී ජනතාවගේ විධායක හා ව්‍යවස්ථාදායක බලය පරම විශ්වාසය මත ක්‍රියාත්මක කිරීමට ඡන්දයෙන් පත්කළ නියෝජිතයින් විසින් මෙසේ නීතියේ ආධිපත්‍යය ගරු නොකිරීමේ තත්වයක් තුල රටේ බරපතල නොසන්සුන්තාවයක් උද්ගත වී ඇති අතර දැනටමත් වටිනා ජීවිත හානි 3 ක් වාර්තා වී ඇත.

14. මෙසේ රටේ නීතියේ ආධිපත්‍ය බිඳ වැටීමෙන් පෙත්සම්කරු ඇතුළු ජනරජයේ පරමාධිකාරී ජනතාවට ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිගෙන ව්‍යවස්ථාගත කොට ඇති නීතිය ඉදිරියේ සමානත්වය හා නීතියේ සමාන

ආරක්ෂාව සඳහා ඇති අයිතිය පැහැදිලිවම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බව පෙත්සම්කරු ප්‍රකාශ කර සිටී.

15. මෙම උද්ගත වී ඇති තත්වය යටතේ ජනරජයේ පරම අධිකාරී ජනතාවගේ අධිකරණ බලය පරම විශ්වාසය මත බල ගන්වන අධිකරණයට නීතියේ ආධිපත්‍ය සහ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා බරපතල වගකීමක් පැවරෙන බව පෙත්සම්කරු ප්‍රකාශ කර සිටී.

16. මේ කරුණ හා සම්බන්ධව මීට ප්‍රථම පෙත්සම්කරු විසින් ගරු අධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට ඉල්ලීමක් කර නොමැති බවත් පෙත්සම සමග ඉදිරිපත් කරන X1 සිට X5 දක්වා ලේඛණ මෙම පෙත්සමේම කොටසක් ලෙස සලකන ලෙසත් ගරු අධිකරණයෙන් ඉල්ලා සිටිමි.

17. මෙම පෙත්සමේ සහ ඒ සමග ඉදිරිපත් කරන සම්ප්‍රකාෂණ සඳහන් කරුණු තහවුරු කිරීමට දිවුරුම් පෙත්සමක් මේ සමග ඉදිරිපත් කර ඇත.

කරුණු මෙසේ හෙයින් පෙත්සම්කරු ගරු අධිකරණයෙන් ඇයද සිටින්නේ;

අ. මෙම පෙත්සම පිළිගෙන පවත්වාගෙන යාමට අවසර දෙන ලෙසත්;

ආ. වගඋත්තරකරුවන්ට නොතිසි නිකුත් කිරීමට නියෝග නිකුත්කරන ලෙසත්;

ඇ. පෙත්සම්කරු ඇතුළු ජනරජයේ පරම අධිකාරී ජනතාවගේ ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තියෙන් පිළිගෙන ව්‍යවස්ථාගත කොට ඇති නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ නීතියේ සමාන ආරක්ෂාව වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවත්;

ඈ. ජන රජයේ නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම සඳහා සහ ජනරජයේ සාමය තහවුරු කිරීම 3 වන වගඋත්තරකරු විසින් නිකුත්කරන ලද X3 දරන විධානය අවලංගු කිරීමේ නියෝගයක් නිකුත්කරන ලෙසත්

ඉ. තවද මෙම නඩුවේ නඩු ගාස්තු ගෙවීම සහ වෙනත් සහන ලබා දීම සඳහා අධිකරණය සුදුසු යැයි තීරණය කරන නියෝගයක් කරන ලෙසත්ය.

N. Kodituwakku

නාගානන්ද කොඩිතුවක්කු........
Attorney-at-Law & Commissioner for Oaths
59, Subadrarama Rd, Nugegoda.
මහජන අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නීතිඥ

වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර මස 30 වන දින දීය